# ජාතික සංවර්ධන පෙරමුණ

ලියාපදිංචි දේශපාලන පක්ෂයකි

NEW

16 OCT 2020
ELECTION COMMISSION

# 2019 සංශෝධිත ව්‍යවස්ථාව

"දේශයේ සමස්ථ සංවර්ධනය සඳහා කැපවෙමු"

(2019.02.04 දින සිට වලංගුයි)

# පටුන


| වගන්තිය | | පිටුව |
|---|---|---|
| 1. | පක්ෂයේ විස්තර | 2 |
| 2. | පක්ෂයේ අරමුණු සහ පරමාර්ථ | 2 |
| 3. | සාමාජිකත්වය | 3 |
| 4. | සාමාජිකයින් සඳහා වූ කොන්දේසි | 4 |
| 5. | පක්ෂ ව්‍යුහය | 4 |
| 6. | විධායක සභාවේ නිලධාරි මණ්ඩලය | 5 |
| 7. | රැස්වීම් | 7 |
| 8. | නිලවරණ | 7 |
| 9. | සංධානගතවීම | 8 |
| 10. | මුදල්, වත්කම් සහ දේපොල | 8 |
| 11. | මුදල් වර්ෂය | 8 |
| 12. | අර්ථ නිරූපණය සහ ව්‍යවස්ථා සංශෝධනය | 8 |


**2019 පෙබරවාරි මස 04 දින,**
**මහනුවර වැව රවුමේ, සුදර්ශී ශාලාවේ පැවති**
**වාර්ෂික මහා සභාවේ දී අනුමත කරන ලද**
**ජාතික සංවර්ධන පෙරමුණේ**
**2019-සංශෝධිත ව්‍යවස්ථාව සහතික කළේ**

ආචාර්ය පී.ඩබ්.එස්.කේ. බණ්ඩාරනායක
සභාපති / ජාතික සංවර්ධන පෙරමුණ

ඒ. එච්. ස්ටීවන් මහතා
ලේකම් / ජාතික සංවර්ධන පෙරමුණ

# ජාතික සංවර්ධන පෙරමුණ
## 2019 සංශෝධිත ව්‍යවස්ථාව

**1. පක්ෂයේ විස්තර**

1.1 **පක්ෂයේ නම:** ජාතික සංවර්ධන පෙරමුණ (මින් පසු මෙහි පක්ෂය ලෙස හැඳින්වේ).
ඉංග්‍රීසි භාෂාවෙන්
National Development Front

1.2 **වර්ණය:** තද තැඹිලි පාට

1.3 **සළකුණ:** පොල් ගෙඩිය

1.4 **ලිපිනය:** 678/5, මුත්තෙට්ටුගොඩ,
දෙවන පටුමග, තලංගම දකුණ,
බත්තරමුල්ල.

1.5 **දුරකථනය:** 011 2789 373

**2. පක්ෂයේ අරමුණු සහ පරමාර්ථ:**

2.1 වර්තමාන ශ්‍රී ලංකික ජනතාව විවිධාකාර වූ අසාධාරණයන්ටත්, පීඩනයන්ටත් ගොදුරු වී අසහනකාරී හා බලාපොරොත්තු සුන්වූ ජීවිතයක් ගෙවනු ලබයි. මෙය දිනෙන් දින වඩාත් වඩාත් උත්සන්න වෙමින් පවතින බැවින් අවසානයේ සමස්ථ සමාජයම විනාශය කරා ළඟාවීම නොවැළැක්විය හැක. මෙම ව්‍යසනයන්ගෙන් ලාංකික ජනතාව මුදවා ගෙන ඔවුනට වඩාත් සුරක්ෂිත සංවර්ධිත සමාජයක් උදාකරලීමේ බැරෑරුම් කාර්යභාරය සඳහා කැපවූ බුද්ධිමත් සහ අවංක පුද්ගලයින්ගේ ප්‍රජාතන්ත්‍රවාදී වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීම සහ සංවිධානය කිරීම මෙම පක්ෂයේ මූලික අරමුණ සහ පරමාර්ථය වේ.

2.2 විවිධ ප්‍රමාණයෙන් හා ස්වරූපයෙන් සිදුවන අසාධාරණ ක්‍රියා තුලින් අද ලාංකික සමාජයේ දූෂිත සුළු පිරිසක් අතිවිශාල සම්පත් ප්‍රමාණයක් හිමි කරගෙන භුක්ති විඳිමින් සිටී. මෙහි ප්‍රතිවිපාකයක් ලෙස බහුතර පොදු ජනතාවට ඉතිරිව ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණයකි. සම්පත් හිඟකම පිළිබඳ මෙම ගැටළුවේ දී සිදුවන සියළු ආකාරයේ අසාධාරණයන් වැළැක්වීම උදෙසා දේශපාලනික, සමාජයීක හා ආර්ථික යන සමස්ථ ක්ෂේත්‍රයන් පොදු ජනතාවගේ යහපත උදෙසා වන පරිදි සකස් කිරීම.

2.3 ශ්‍රී ලාංකික ජන සමාජයේ ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරන, එමෙන්ම බහුතරය ද වන ග්‍රාමීය ජනතාව ප්‍රමුඛත්වයේලා සළකා, ඔවුන්ගේ සාමූහිකත්වය සහ සහජීවනය වර්ධනය වන ලෙසත්,

ආර්ථිකය ශක්තිමත් වන ලෙසත් සැලසුම් සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

2.4 ග්‍රාමීය සංවර්ධනය මූලික කරගනිමින්, සියළු නාගරික දියුණුව විධිමත්ව සැලසුම් කිරීම තුලින් සමස්ථ ජාතික සංවර්ධනයක් ගොඩනංවා ගැනීමට කටයුතු කිරීම.

2.5 සාකච්ඡා, දේශණ, වැඩමුළු සහ රැස්වීම් පැවැත්වීමෙන් ද, පත්‍රිකා, පෝස්ටර, පොත්-පත් සහ සියළු ජනසන්නිවේදන මාධ්‍යයන් භාවිත කිරීමෙන් ද, ජනතාව දැනුවත් කිරීම.

2.6 ඉහත අරමුණු ඉටුකර ගැනීම පිණිස ගෙයින්-ගෙයට, ගමින්-ගමට. නගරයෙන්-නගරයට යමින් ප්‍රජාතන්ත්‍රවාදීව ජනතාවට කරුණු පැහැදිළි කරදීම සහ ජනතාව සංවිධාන කිරීම.

2.7 සියළුම ආකාරයේ මැතිවරණ වලට තරග කර පක්ෂයේ ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙල ජනතාව අතරට ගෙන ගොස් සමස්ථ ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ සෞභාග්‍යය උදා කිරීම.

**3. සාමාජිකත්වය:**

3.1 පක්ෂයේ අරමුණු හා පරමාර්ථවලට එකඟ වන්නාවූ ද, 4 වෙනි වගන්තිය යටතේ දැක්වෙන සාමාජිකයින් සඳහා වූ කොන්දේසි පිළිගන්නා වූ ද, වයස අවුරුදු 18 ට වැඩි, ශ්‍රී ලංකාවේ ඡන්දදායකයෙක් වීමට සුදුසුකම් ඇති ඕනෑම පුද්ගලයෙකුට සාමාජිකත්වය ලබා ගත හැක.

3.2 මේ සඳහා සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයක් සහ අදාළ සාමාජික මුදල තමා පදිංචි ප්‍රදේශයේ පක්ෂ ශාඛාව වෙත හෝ පක්ෂයේ මූලස්ථානය වෙත ඉදිරිපත් කළ යුතුය.

3.3 හය මාසයකට නොඅඩු කාලයක් සාමාජිකත්වය දරා ඇත්තා වූ ද, පක්ෂයේ අරමුණු, පරමාර්ථයන්, ව්‍යවස්ථාව හා ක්‍රියා මාර්ගයන් පිළිබඳ අවබෝධයක් ලද්දා වූ ද, පක්ෂයේ උන්නතිය පිණිස ක්‍රියාකාරී මෙහෙයක් ඉටුකරන්නා වූ ද, සාමාජිකයෙකුට ක්‍රියාකාරී සාමාජිකත්වය දෙනු ලැබේ.

3.4 යම් සාමාජිකයෙකු ව්‍යවස්ථාවට පටහැනිව හෝ විනය විරෝධීව කටයුතු කළහොත් තිදෙනෙකුගෙන් සමන්විත විනය කමිටුවක් මගින් කරනු ලබන පරීක්ෂණයක තීන්දුව අනුව සාමාජිකත්වය පිළිබඳ තීරණය කරනු ලැබේ.

3.5 මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි වෙනත් පක්ෂයක සාමාජිකත්වය ගැනීමෙන් ජාතික සංවර්ධන පෙරමුණේ සාමාජිකත්වය අහෝසි වේ.

3.6 වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100/= කි.

## 4. සාමාජිකයින් සඳහා වූ කොන්දේසි:

සෑම සාමාජිකයෙකුම පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන බවටත්. ඒවා කඩ නොකරන බවටත් දිවුරා පොරොන්දු වී සාමාජිකත්වය ලබා ගත යුතුයි.

4.1 ජාතිය, කුලය, ආගම, වර්ගය, ප්‍රදේශය සහ වෘත්තීය භේද වලින් තොරව සෑම පුද්ගලයෙකුටම එක හා සමානව සැලකීම.

4.2 පරිසරය සහ ජාතික සම්පත් විනාශ නොකිරීම සහ පොදු දේපොළ ආරක්ෂා කිරීම.

4.3 අල්ලස, වංචාව, දූෂණය, අපරාධ සහ නීති විරෝධී ක්‍රියාවන්ගෙන් වැලකීම.

4.4 විරුද්ධ දේශපාලන මත හා විවේචන ඉවසීම සහ දේශපාලන කරුණු අරබයා ද්වේශ සහගත ලෙස කටයුතු නොකිරීම.

4.5 පක්ෂය භේද කිරීමේ හෝ පක්ෂයට හානිකර වූ කටයුතු වලින් වැළකීම සහ පක්ෂයේ උන්නතිය උදෙසා කටයුතු කිරීම.

## 5. පක්ෂ ව්‍යුහය:

5.1 <u>ග්‍රාම ශාඛා:</u> පක්ෂයේ මූලික සංවිධානය වන්නේ ග්‍රාම ශාඛාවයි. සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති තනතුරු 3 ක් සහ උප ලේකම් තනතුරු 3 ක් ලෙස ග්‍රාම ශාඛාවලට නිලධාරීන් පත් කෙරේ. තවද එම ග්‍රාමයේ පදිංචි ප්‍රාදේශීය සභාවක් නියෝජනය කරන මන්ත්‍රීන් නිල බලයෙන් නිලධාරී මණ්ඩලයට ඇතුලත් වේ.

5.2 <u>දිස්ත්‍රික් ශාඛා:</u> සෑම ග්‍රාම ශාඛාවකින්ම නියෝජිතයා බැගින් සමන්විත දිස්ත්‍රික් ශාඛාවන් පිහිටුවා ගත යුතුය. සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති 3 සහ උප ලේකම් 3 ලෙස දිස්ත්‍රික් ශාඛාවලට නිලධාරීන් පත් කෙරේ. තවද එම දිස්ත්‍රික්කයේ පදිංචි පළාත් සභාවක් නියෝජනය කරන මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභා සභාපතිවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නිල බලයෙන් දිස්ත්‍රික් ශාඛාවේ නිලධාරී මණ්ඩලයට ඇතුලත් වේ.

5.3 <u>දේශපාලන මණ්ඩලය:</u> සෑම දිස්ත්‍රික් ශාඛාවකින්ම නියෝජිතයෙක් බැගින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පක්ෂයේ විධායක සභාවේ නිලධාරීන්ගෙන් දේශපාලන මණ්ඩලය සමන්විත වේ. දේශපාලන මණ්ඩලයේ රැස්වීම් මෙහෙයවීම පක්ෂයේ සභාපති සහ ලේකම් ගේ මූලිකත්වයෙන් සිදු වේ.

5.4 <u>විධායක සභාව:</u> ජාතික සංවර්ධන පෙරමුණේ මහාසභා රැස්වීමේ දී නිලවරණයෙන් තෝරාපත් කරගනු ලැබූ නිලධාරී මණ්ඩලයෙන් විධායක සභාව සමන්විත වේ. පක්ෂය පාර්ලිමේන්තුව නියෝජනය කරන විට විධායක සභාවේ අර්ධයකට නොවැඩි, උපරිම සමාජිකයින් සංඛ්‍යාවක් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත විය යුතුය. එනම් සමාජිකයින් 11 ක විධායක සභාවේ උපරිම මන්ත්‍රීවරුන් 05 දෙනෙක් පත්විය යුතුය.

## 6. විධායක සභාවේ නිලධාරි මණ්ඩලය:

### 6.1 සභාපති

(1) පක්ෂ නායක හා පක්ෂයේ විධායක පරිපාලකයා වේ.

(2) පක්ෂයේ රැස්වීම් කැඳවීම තීරණය කරන්නා වේ.

(3) පක්ෂයේ සියළු රැස්වීම්වල මුලසුන දරා මෙහෙයවන්නා වේ.

(4) පක්ෂයේ ඉලක්ක හා අරමුණු ඉටු කර ගැනීමට විනයානුකූලව පක්ෂය මෙහෙයවිය යුතුය.

(5) පක්ෂය වෙනුවෙන් සියළු ආකාරයේ ජනමාධ්‍ය සාකච්ඡාවලට, දේශපාලන සංවාදවලට සහභාගී වීමේ සහ සහ ගිවිසුම්වලට එළැඹීමේ බලය ඇත.

(6) ව්‍යවස්ථාව හෝ ඉන් ආවරණය නොවන ඕනෑම කරුණක් අර්ථ නිරූපණය කිරීමේ බලය ඇති අතර එය අනුමැතිය සඳහා ඊ ළඟ විධායක සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතු වේ.

### 6.2 ලේකම්

(1) පක්ෂයේ නියෝජ්‍ය නායක වේ.

(2) පක්ෂයේ සියළු රැස්වීම් වාර්තාගත කිරීම කළ යුතු වේ.

(3) පක්ෂයේ ඉලක්ක හා අරමුණු ඉටු කර ගැනීමට විධායක සභාවේ අනුමැතියට යටත්ව පක්ෂය මෙහෙයවිය යුතුය.

(4) පක්ෂය වෙනුවෙන් ලිපි-ලේඛනවලට අත්සන් කිරීමේ බලය ඇත.

(5) පක්ෂ ව්‍යවස්ථාව සහ සාමාජිකයින් පිළිබඳ විස්තර ඕනෑම මොහොතක ඉදිරිපත් කිරීමට හැකි විය යුතුය.

(6) පක්ෂය වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් වලට සහභාගී වීම සහ නිවැරදිව මැතිවරණ නාමයෝජනා ඉදිරිපත් කිරීම කළ යුතු වේ.

### 6.3 භාණ්ඩාගාරික

(1) පක්ෂයේ ගිණුම් පවත්වා ගත යුතු වේ.

(2) පක්ෂය සඳහා අරමුදල් එක්රැස් කිරීම කළ යුතු වේ.

(3) සෑම වර්ෂයකම ජනවාරි මස 31 ට පෙර පසුගිය මුදල් වර්ෂය සඳහා විගණනය කළ අයවැය වාර්තාවක් පක්ෂය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

(4) පක්ෂයේ සාමාජික ගාස්තු එකතු කිරීම සහ වියදම් කළමණාකරනය කළ යුතුය.

(5) පක්ෂය වෙනුවෙන් බැංකු ගිණුම් වල සහ චෙක්පත්වල අත්සන් කිරීමේ බලය ඇත.

### 6.4 ජාතික සංවිධායක

(1) පක්ෂයේ සියළු ප්‍රචාරක කටයුතු හා රැස්වීම් සංවිධානය කළ යුතු වේ.

(2) ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම පක්ෂයේ ශාඛා පිහිටුවීමට පුරෝගාමී වී සංවිධානය කර ඒවා පිහිටුවිය යුතු වේ.

(3) සාමාජිකයින්ගේ හා ශාඛා සංවිධානවල මත සහ යෝජනා පක්ෂයේ විධායක කමිටුවට ඉදිරිපත් කළ යුතුය.

(4) පක්ෂය වෙනුවෙන් ප්‍රචාරක කටයුතු හා උද්ඝෝෂණ සංවිධානයට මූලිකත්වය දිය යුතු වේ.

**6.5 නියෝජ්‍ය සභාපති**

පක්ෂයේ සභාපති නොමැති අවස්ථා වලදී රැස්වීම්වල මුලසුන දරා මෙහෙයවීම සහ සහ සභාපති ගේ කටයුතු වලට සහාය දීම කළ යුතු වේ.

**6.6 නියෝජ්‍ය ලේකම්**

පක්ෂයේ ලේකම් නොමැති අවස්ථා වලදී පක්ෂයේ රැස්වීම් වාර්තාගත කිරීම සහ ලේකම් ගේ කටයුතු වලට සහාය දීම කළ යුතු වේ.

**6.7 උප ලේකම් (මැතිවරණ)**

සියළුම මැතිවරණ සඳහා නාමයෝජනා එකතු කිරීම, ඒවා පක්ෂයේ විධායක සභාවට ලබාදීම සහ සුදුසු අපේක්ෂකයින් තෝරා ගැනීමට සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගවලට සහාය දීම කළ යුතු වේ.

**6.8 උප ලේකම් (පරිපාලන)**

පක්ෂයේ සභාපතිට, ලේකම්ට සහ විධායක සභාවට පරිපාලන කටයුතු වලදී සහාය දිය යුතු වේ. තවද පක්ෂය විසින් පත්කරනු ලබන ත්‍රිපුද්ගල විනය කමිටුවේ අනිවාර්යය සමාජිකයෙකි.

**6.9 උප ලේකම් (මාධ්‍ය)**

පක්ෂයට අදාළ සියළු ආකාරයේ ලිපි ලේඛන හා තොරතුරු එක් රැස් කිරීම ඒවා අවශ්‍ය පරිදි පක්ෂයේ සභාපතිට, ලේකම්ට සහ විධායක සභාවට ලබා දීම, පක්ෂය වෙනුවෙන් සන්නිවේදන කටයුතු සැලසුම් කිරීම සහ විධායක සභාව විසින් පවරනු ලබන වගකීම් ඉටුකිරීම කළ යුතු වේ.

**6.10 උප සභාපති (ජාත්‍යන්තර)**

විදේශ රටවල පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්, ශ්‍රී ලාංකික සම්භවය ඇති පුද්ගලයින් සහ පක්ෂයට උපකාර කිරීමට කැමති විදේශීය රටවල්, සංවිධාන, දේශපාලන පක්ෂ සහ පුද්ගලයින් සම්බන්ධීකරණය කර පක්ෂයේ උන්නතියට ඒ අයගේ සහාය ලබා ගැනීම සඳහා පක්ෂ නායකයාට සහාය වීම.

**6.11 උප ලේකම් (ප්‍රචාරක)**

මැතිවරණවලදී හා පක්ෂයේ රැස්වීම්, පෙළපාලි හා වැඩසටහන් සඳහා පක්ෂයට අවැසි සියළු ආකාරයේ ප්‍රචාරක කටයුතු සංවිධානයට කිරීමට සහ ක්‍රියාවට නැංවීමට නැංවීමට ජාතික සංවිධායකට සහාය වීම.

## 7. රැස්වීම්:

### 7.1 වාර්ෂික මහාසභා රැස්වීම

(1) සෑම වර්ෂයකම ජනවාරි 01 සහ මාර්තු 31 අතර දිනයක පැවැත්විය යුතුය.

(2) පක්ෂයේ විධායක සභාව විසින් රැස්වීම පවත්වනු ලබන ස්ථානය, දිනය සහ වේලාව තීරණය කළ යුතුය.

(3) පක්ෂයේ ලේකම් විසින් දින 14 කට පෙර මහසභා රැස්වීම කැඳවීමේ ලිපිය හා න්‍යාය පත්‍රය සාමාජිකයින් වෙත දැන්විය යුතුය.

(4) මහාසභා රැස්වීමේ ගණපූරණය 100 කි.

### 7.2 මහාසභා රැස්වීම්

(1) අවශ්‍යතාවය පරිදි පක්ෂයේ විධායක සභාව විසින් මහාසභා රැස්වීම පවත්වන ස්ථානය, දිනය සහ වේලාව තීරණය කළ යුතුය.

(2) පක්ෂයේ ලේකම් විසින් දින 07 කට පෙර මහසභා රැස්වීම කැඳවීමේ ලිපිය හා න්‍යාය පත්‍රය සාමාජිකයින් වෙත දැන්විය යුතුය.

(3) මහාසභා රැස්වීමේ ගණපූරණය 100 කි.

### 7.3 විශේෂ හෝ හදිසි රැස්වීම්

(1) විශේෂ කරුණු අරබයා අවශ්‍යතාවය පරිදි පක්ෂයේ විධායක සභාව විසින් විශේෂ හෝ හදිසි රැස්වීම් පැවැත්වීම තීරණය කළ හැකි අතර රැස්වීම පවත්වනු ලබන ස්ථානය, දිනය සහ වේලාව තීරණය කළ යුතුය.

(2) පක්ෂයේ ලේකම් විසින් විශේෂ රැස්වීම පිළිබඳ සාමාජිකයින් වෙත දැන්විය යුතුය.

(3) විශේෂ හෝ හදිසි රැස්වීමේ ගණපූරණය 50 කි.

### 7.4 විධායක සභා රැස්වීම්

(1) අවම වශයෙන් මාස දෙකකට සැරයක් වත් පක්ෂ මූලස්ථානයේ හෝ වෙනත් යෝජිත ස්ථානයක විධායක සභා රැස්වීම් පැවැත්විය යුතුය.

(2) පක්ෂයේ විධායක සභාව විසින් දිනය සහ වේලාව තීරණය කළ යුතුය.

(3) පක්ෂයේ ලේකම් විසින් විධායක සභාවේ සෑම නිලධාරියෙකුටම රැස්වීම් පිළිබඳ දැන්විය යුතුය.

(4) විධායක සභා රැස්වීමේ ගණපූරණය සියළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකි. එනම් 08 දෙනෙකි.

## 8. නිළවරණ:

වාර්ෂික මහාසභා රැස්වීමක දී, වාර්ෂ දෙකකට වතාවක් පක්ෂයේ නිළවරණය පැවැත්විය යුතුය. එසේ පත්වන නිළධාරී මණ්ඩලය ඊ ළඟ නිළවරණය පැවැත්වෙන දින තෙක් බල සහිත වන්නේ ය. නිළවණයේ දී පෙර පැවති මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සම්මත වූ විගණනය කරන ලද ආයවැය වාර්තාවක් සහ මහාසභා රැස්වීමේ වාර්තාව පක්ෂයේ ලේකම් විසින් මැතිවරණ කොමිසමට බාර දිය යුතුය. පුරප්පාඩු වන තනතුරු සඳහා, නිළවරණයක් පැවැත්වෙන තෙක්, තාවකාලික නිලධාරීන් පත්කිරීම් විධායක සභාව විසින් කළ යුතුය.

**9. සංධානගතවීම:**

9.1 පක්ෂයේ සභාපති, ලේකම් ඇතුළුව විධායක සභාවේ බහුතරයක යෝජනා ස්ථිරත්වයෙන්, මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි වූ හෝ නොවූ ක්‍රියාකාරී දේශපාලන පක්ෂ සමග ජාතික සංවර්ධන පෙරමුණට සංධානගත විය හැක.

9.2 අවම වශයෙන් එම සන්ධානයට ජාතික සංවර්ධන පෙරමුණේ සභාපති සහ ලේකම් ඇතුලත් විය යුතුය.

9.3 සන්ධානය පිහිටුවීමට මූලිකත්වය ගන්නා පක්ෂයට සන්ධානයේ ලේකම්කම ලැබිය යුතුය.

9.4 සන්ධානයේ ව්‍යවස්ථා සහ නීති රීති එහි හවුල්කාර පක්ෂ හා සංවිධාන සඳහා බලපාලන අතර, ඒවයේ සාමාජිකයින් සෑම විටම අදාල පක්ෂයේ ව්‍යවස්ථාවට ද යටත් වේ.

**10. මුදල්, වත්කම් සහ දේපොල:**

10.1 පක්ෂය වෙත ලැබෙන සාමාජික ගාස්තු, ආධාර සහ වෙනත් ඉපැයීම් සියල්ල පක්ෂයේ නමින් විවෘත කළ ගිණුමක තැන්පත් කළ යුතුය.

10.2 සියළු ආකාරයේ ගෙවීම් සඳහා භාණ්ඩාගාරිකගේ අත්සන සහ ලේකම් හෝ සභාපති යන දෙදෙනාගෙන් කෙනෙකුගේ අත්සන තිබිය යුතුය.

**11. මුදල් වර්ෂය:**

11.1 සෑම ලිත් වර්ෂයකම ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය මුදල් වර්ෂය වේ.

11.2 මුදල් වර්ෂය අවසාන වී මාස දෙකක් යාමට ප්‍රථම භාණ්ඩාගාරික විසින් විගණනය කළ වාර්ෂික අය-වැය වාර්තාව විධායක සභාවට සහ වාර්ෂික මහාසභා රැස්වීමට ඉදිරිපත් කළ යුතු වේ.

**12. අර්ථ නිරූපණය සහ ව්‍යවස්ථා සංශෝධනය:**

12.1 පක්ෂයේ ව්‍යවස්ථාවට එකතු කෙරෙන අතුරු ව්‍යවස්ථා ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුය.

12.2 පක්ෂයේ ව්‍යවස්ථාවට හෝ අතුරු ව්‍යවස්ථාවලට සංශෝධන ඉදිරිපත් කළ හැක්කේ වාර්ෂික මහාසභා රැස්වීමක දී පමණි.

12.3 සංශෝධන පිළිබඳව න්‍යාය පත්‍රයට ඇතුලත් කොට ඒවා අදළ සියළුම සාමාජිකයින්ට සති දෙකකට පෙර දැනුම් දිය යුතුය.

12.4 ඕනෑම සංශෝධනයක් පැමිණි සාමාජිකයින් 2/3 ක ඡන්දයෙන් අනුමත විය යුතුයි.